පොලිස් ස්ථානාධිපතිවරයෙකු විසින් පොලිස් කොස්තාපල්වරියකට ලිංගික අතවර කිරීමේ සිදුවීමක්, පුවත්පත් කිහිපයක සිරස්තල ඔස්සේ වාර්තා කර තිබූ ආකාරය පහත ලෙසින් දැක්විය හැක.

පොලිස් කාන්තාවට අමුතු 'ඩියුටියක්' දැමූ ගන්දර ඕ.අයි.සී. අනංගයා - ඉරිදා දිවයින (2022-01-02)

- පොලිස් කතට ගින්දර දුන් ගන්දර OIC - සති අග අරුණ (2022-01-02)

- ගන්දර පොලිස් ලොක්කාගේ අනඟ රඟුම - සිළුමිණ (2022-01-02)

- කොස්තාපල්වරියකට අතවර සිද්ධියේ ඕ.අයි.සී. රිමාන්ඩ් - ලංකාදිප (2021-12-27)

එසේ නම්,

1) නීතියෙන් දඬුවම් ලැබිය යුතු වරදක් වන ලිංගික අතවරයක් "අමුතු ඩියුටියක්" හෝ "ගින්දර දීමක්" හෝ "අනඟ රඟුමක්" ලෙසින් ඉදිරිපත් කිරීම ඔස්සේ, නැතිනම් එම සිදුවීමෙහි සැකකරු "අනංගයෙකු" ලෙසින් චිත්‍රණය කිරීම ඔස්සේ, එම වරදෙහි සැබෑ බරපතල භාවය සන්නිවේදනය වේ යැයි ඔබ සිතන්නේ ද?

2) පුවතකට සිරස්තල යෙදීමේදී නිර්මාණශීලී වීමේ අයිතිය මාධ්‍ය අත පැවතියද, ඒ ඔස්සේ සිදුවීම භාවාතිශය ලෙසින් දැක්වීමත් (Sensationalised), ඉන් සිදුවීමේ නිරවද්‍යභාවයට හානි වීමක් හෝ සිදුවීම සුළු කොට දැක්වීමක් සිදුවන්නේ නම්, එය මාධ්‍ය ආචාර ධාර්මික ගැටළුවක් නොවන්නේ ද?

3) එය ලිංගික අතවරයක් සුළු කොට දැක්වීමක් යැයි ඔබ සිතන්නේ නම්, එවැනි වාර්තාකරණයන් ඔස්සේ මෙවැනි අපරාධ සාමාන්‍යකරණයක් (normalisation) වීමක් නොවනු ඇතිද?

4) ඒ අනුව, වඩාත් යෝග්‍ය යැයි ඔබ තෝරාගන්නේ ඉහත සිරස්තලයන්ගෙන් කුමක්ද?